**ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනය - 2022**

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ශ්‍රී ලංකා ත්‍රෝබෝල් සම්මේලනයේ (“සම්මේලනයේ”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,065 ක ඌනතාවයක් සහ මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 81,940 කින් ඉක්මවා ඇත. මෙයින් ඇඟවෙන්නේ, සම්මේලනය ඉදිරියට පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවයි. කෙසේ වෙතත්, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරිම සඳහා විධායක කමිටුව මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීම සඳහා විධායක කමිටුව මෙම තත්ත්වය සලකා බැලිය යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

සමාලෝචිත වර්ෂය සඳහා සම්මේලනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,065 ක ඌණතාවක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වසරේ අතිරික්තය රු. 7,049 කි. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයහි රු. 10,114 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 78,967 කින් වැඩි වීම මෙම පිරිහීමට හේතු විය.